00071

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය

කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධි පාඨමාලාව

**AFU 4572 - සාර්ව ආර්ථික විද්‍යාව**
**අවසාන පරීක්ෂණය - 2023/2024**
**කාලය - පැය තුනයි (03)**

---

*දිනය: 2025 ජුනි 08* *වේලාව: ප.ව. 1.30 - ප.ව. 4.30.*

---

<u>උපදෙස්:</u>

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සමන්විත වේ.
- ප්‍රශ්න පහකට <u>(05)</u> පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්න වලට සමාන ලකුණු හිමිවේ.
- කරුණාකර ඔබේ <u>විභාග අංකය</u> පිළිතුරු පත්‍රයේ ලබා දී ඇති ඉඩෙහි දක්වන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය <u>පිටු තුනකින් (03)</u> සමන්විත වේ.
- පිළිතුරු පත්‍රය ඔබේ පිළිතුරු පොත් පිංචට අමුණන්න.
- වැඩසටහන් සම්පදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ඇත.

<u>ප්‍රශ්න අංක 01</u>.

අ) i. "බොහෝ අවස්ථාවලදී සාර්ව ආර්ථික විද්‍යාව සමස්ත ආර්ථික හැසිරීම කෙරෙහි අවධානය යොමු කරයි" පැහැදිලි කරන්න. **(ලකුණු 05)**

ii. පොලී අනුපාතය, විනිමය අනුපාතය වැනි ප්‍රමුඛ සාර්ව ආර්ථික දර්ශකවල හැසිරීමේ බලපෑම විශ්ලේෂණය කිරීමේ දැනුම, ව්‍යාපාරික කළමනාකරුවෙකුට ඵලදායී තීරණ ගැනීමට උපකාර වන්නේ කෙසේද? උදාහරණ භාවිතා කරමින් පැහැදිලි කරන්න. **(ලකුණු 07)**

ආ) i. ජාතික ආදායම මැනීම වැදගත් වන්නේ ඇයි? පැහැදිලි කරන්න. **(ලකුණු 04)**

ii. ජාතික ආදායම මැනීමේ සීමාවන් මොනවාද? පැහැදිලි කරන්න. **(ලකුණු 04)**

<u>ප්‍රශ්න අංක 02.</u>

අ) අංශ තුනේ ආර්ථිකයක, ගෘහස්ථ, ව්‍යාපාරික සහ රජයේ අංශ අතර ආදායම් ප්‍රවාහය රූප සටහනක් භාවිතා කරමින් පැහැදිලි කරන්න. **(ලකුණු 03)**

ආ අංශ තුනේ ආර්ථිකයක විස්තර පහත දැක්වේ (අගයන් රු. බිලියන වලින්):

$C = 116 + dY_d$ (පරිභෝජන ශ්‍රිතය) $MPS = 0.2$ ( ආන්තික ඉතුරුම් නැඹියාව)
$I = 108$ (ස්වායත්ත ආයෝජන)
$T = 10$ (ස්වායත්ත බදු)
$G = 98$ (ස්වායත්ත රජයේ වියදම්)

i. පරිභෝජන ශ්‍රිතය (Consumption Function) සහ ඉතුරුම් ශ්‍රිතය (Savings Function) භාවිතා කරමින් ජාතික ආදායමේ සමතුලිත මට්ටම වෙන් වෙන්ව ගණනය කරන්න. **(ලකුණු 04)**

ii. ස්වායත්ත බදුවලට අමතරව, රජය 20% ආදායම් බද්දක් සහ රු. බිලියන 05ක සංක්‍රාම ගෙවීම් (Transfer Payment) හඳුන්වා දුනහොත්, නව සමතුලිත ජාතික ආදායම් මට්ටම සොයන්න. (ලකුණු 03)

iii. වියදම් සහ බදු ගුණක ගණනය කරන්න. (ලකුණු 02)

iv. ආර්ථිකය විවෘත වන අතර පහත වෙනස්කම් සිදුවේ නම්:

$X = 48$ (ස්වායත්ත අපනයන)

$M = 45 + 0.1Y$ (ආනයන ශ්‍රිතය)

සමතුලිත ජාතික ආදායම් මට්ටම සොයන්න. (ලකුණු 04)

v. දේශීය රුපියලේ අගය ඉහළ යාමත් සමඟ ස්වායත්ත අපනයන රු. බිලියන 2 කින් වෙනස් වී ස්වායත්ත ආනයන රු. බිලියන 1 කින් වෙනස් වේ නම්, නව සමතුලිත ජාතික ආදායම් මට්ටම සොයන්න.

(ලකුණු 04)

<u>ප්‍රශ්න අංක 03.</u>

අ) i. "IS" වක්‍රය මගින් නිරූපණය වන්නේ කුමක්ද? "IS" වක්‍රය ඍණ බෑවුමක් ගන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 03)

ii. "LM" වක්‍රය මගින් නිරූපණය වන්නේ කුමක්ද? LM වක්‍රය ධන බෑවුමක් ගන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 03)

ආ) IS/LM රාමුව භාවිතා කරමින් පහත වෙනස්කම් ආර්ථිකයට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

i. රජය විසින් බදු අනුපාතය වැඩි කර ඇත.

ii. ආර්ථිකයේ සාමාන්‍ය මිල මට්ටම ඉහළ ගොස් ඇත.

iii. රජය යටිතල පහසුකම් සඳහා වියදම් වැඩි කර ඇත.

iv. ආර්ථිකය උත්තේජනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ප්‍රසාරණාත්මක මුදල් ප්‍රතිපත්ති හඳුන්වා දී ඇත. (ලකුණු 10)

ඇ) මුදල් ඉල්ලුම, පොලී අනුපාතය මත කිසිසේත් බලපෑමක් නොකරන විට, ආදායම් මට්ටම වෙනස් කිරීම සඳහා වඩාත් ඵලදායී ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියද (Fiscal Policy) නැතහොත් මුදල් ප්‍රතිපත්තියද (Monetary Policy)? රූප සටහන් භාවිතා කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

<u>ප්‍රශ්න අංක 04.</u>

අ) i. භාණ්ඩ හුවමාරු ක්‍රමයට (Barter System) ආවේණික වූ අවාසි හඳුනාගන්න. (ලකුණු 04)

ii. මුදලේ කාර්යයන් මොනවාද? ඉහත (i) කොටසේ හඳුනාගත් භාණ්ඩ හුවමාරු පද්ධතියේ සීමාවන් මගහරවා ගැනීමට මෙම කාර්යයන් උපකාර වන්නේ කෙසේද? පැහැදිලි කරන්න. (ලකුණු 06)

ආ) i. "නාමික" (Nominal) සහ "මූර්ත" (Real) මුදල් සැපයුම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. "මූල්‍ය අතරමැදිකරු" යනු කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. තැන්පතු සංගුණකය වාණිජ බැංකුවල මුදල් නිර්මාණය කිරීමේ මට්ටම තීරණය කරන්නේ කෙසේද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

<u>ප්‍රශ්න අංක 05.</u>

අ) i. "අවපාතෝත්ධමනය" (Stagflation) යනු කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 03)

ii. "ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය" (Demand Pull Inflation) සහ "මුල්‍යවාදී පැතිකඩින්" (Monetarist View) දකින උද්ධමනය සංසන්දනය කර වෙනස්කම් දක්වන්න. (ලකුණු 06)

iii. ආර්ථිකයක උද්ධමන පීඩනය පාලනය කිරීම සඳහා ඇති විවිධ ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 06)

ආ) කෙටිකාලීන ෆිලිප්ස් වක්‍රය (Short Run Phillips Curve) යනු කුමක්ද? එය රූප සටහනක් භාවිතා කරමින් පැහැදිලි කරන්න (ලකුණු 05)

<u>ප්‍රශ්න අංක 06.</u>

අ) i. "විරැකියා අනුපාතය" වැදගත් සාර්ව ආර්ථික දර්ශකයක් ලෙස සැලකෙන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. "ස්වභාවික විරැකියා අනුපාතය" (Natural Rate of Unemployment) යනු කුමක්ද? අර්ථ දක්වන්න. (ලකුණු 02)

iii. විරැකියාවේ පිරිවැය (Costs of Unemployment) මොනවාද? පැහැදිලි කරන්න.. (ලකුණු 04)

ආ) i. රූප සටහනක් භාවිතා කරමින් "ව්‍යාපාරික චක්‍රයේ" (Business Cycle) අදියර හඳුනා ගන්න. (ලකුණු 05)

ii. "කේන්සියානු ව්‍යාපාරික චක්‍රය පිළිබඳ න්‍යාය" (Keynesian theory of Business Cycle) යනු කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 05)

*සියලුම හිමිකම් ඇවිරිණි.*